# 2022 ජනවාරි මස මාසික සභා රැස්වීම
# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 ජනවාරි මස මාසික සභා රැස්වීම 2022.01.13 වන දින පෙ.ව. 10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබිය. එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2021.12.16 දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1. ජල බිල් පතේ නම සංශෝධනය කිරීම

ජේ.සමන්ත කමල්සිරි නමින් ඇති අංක UD 302 දරණ ජල බිල් පත ඩබ්ලිව්.නිශාන්ත නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

### 2.2. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන - 2020 ව්‍යාපෘති පවරාදීම.

පහත සඳහන් ව්‍යාපෘති නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන බව දන්වා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක OPDS/PLD/DV/01/Sapiri Gamak/2020 හා 2021.12.27 දිනැති ලිපිය දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ග්‍රාම නිලධාරී වසම | අනුමත ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| 01. | මිදෙල්ලදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම | ඕපනායක | 500,000.00 |
| 02. | හෙට්ටිගෙවත්ත මාර්ගය කොන්ක්‍රිට් කිරීම | මීගහවෙල | 500,000.00 |
| 03. | අකරුල්ල බෝගහකුඹුර තලාව මාර්ගය කොන්ක්‍රිට් කිරීම | අකරුල්ල | 500,000.00 |
| 04. | ඉදිරිමිණිකන්ද කිරිල්දෙනිය මාර්ගය කොන්ක්‍රිට් කිරීම | පොල්වත්තහේන | 500,000.00 |

### 2.3. "සපිරි ගමක්"ජනතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන - 2020 ව්‍යාපෘති පවරාදීම.

ඉහත වැඩසටහන යටතේ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති 75ක නඩත්තු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන බව දන්වා ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක OPDS/PLD/DV/01/Sapiri Gamak/2020 හා 2021.12.27 දිනැති ලිපිය දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

### 2.4. හඳගිරිය උඩවලව මාර්ගය සම්බන්ධවයි

ඉහත මාර්ගයේ භාවිතා නොකරන ABS උපකරණය හා අදාල කණු ඉවත් කිරීම ඇඹිලිපිටිය ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු ඒකකය මඟින් සිදු කල හැකි බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා ප්‍රධාන ඉංජිනේරු ඒකකය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු ඒකකය වෙත යොමු කරන ලද ලිපියේ පිටපත දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

### 2.5. එක්සත් ජාතික පක්ෂයේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ කණ්ඩායම් නායක ධූරය වෙනස් කිරීම.

ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම් නායක එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා එම ධූරයෙන් ඉවත් කර නව කණ්ඩායම් නායක ලෙස ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා පත් කර ඇති බව දන්වා එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් විසින් එවන ලද ලිපියේ පිටපත සභාවට ඉදිරිපත් කරන ලදී.

### 2.6. පළාත් පාලන ආයතන වල 2022 වර්ෂයට අදාලව උපාය මාර්ගික සැලැස්ම සකස්කිරීම.

ඉහත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/DE/2/2/1 හා 2022.01.13 දිනැති විද්‍යුත් මාධ්‍යයෙන් යොමු කරන ලද ලිපියට අනුව,මෙම සභාවට අදාල උපාය මාර්ගික සැලැස්ම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ යෝජනාසහ අදහස් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. කයිකාර ගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

උතුරු හුණුවල ග්‍රාම නිලධාරී වසමේ කයිකාරගොඩ ග්‍රාමයට පිවිසෙන මාර්ගය මේ වන විට දැඩි සේ අබලන් තත්ත්වයට පත්වී ඇති බවත්, පසුගිය කාලයේ පැවැති වර්ෂාව හේතුවෙන් නායයෑම් වලට ලක්ව මේ වන විට එම මාර්ගයේ ගමන් කිරීමද දැඩි අවදානම් තත්ත්වයකට පත්ව ඇති බැවින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් විසින් එවන ලද ඉල්ලීමකට අනුව, ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වා අංක OPDS/PL/FO-05/මහජන පැමිණිලි - 2021 හා 2022.01.11 දිනැතිව එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

### 3.3. කොටස් කම්කරු ක්‍රමය යටතේ පළාත් මාර්ග දෙපස කැලෑ රහිතව පවත්වාගෙන නඩත්තු කිරීම.

පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතලපහසුකම් සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් අංක SG/MPR/DE/02 හා 2022.01.07 දිනැතිව එවන ලද ලිපියට අනුව පළාත් පාලන ආයතන වලින් මාර්ග දෙපස කැලෑ රහිතව නඩත්තු කරගෙන යාම සඳහා ඉල්ලුම් කරන ලද අතර පළාත් පාලන මාර්ග ලේඛනය සමග එවා ඇති බවත්,අදාල පළාත් පාලන ආයතන විසිනි අදාල පාර්ෂව ගිවිසුම්ගතව මෙම මාර්ග නඩත්තු කර පවත්වාගෙන යාමට අදාල උපදෙස් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරන ලෙසත් දන්වා විධායක ඉංජිනේරු වෙත යවන ලද ලිපියේ පිටපතක් ඉදිරි කටයුතු සඳහා එවා ඇති බැවින් එය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය

## 5. කල් දී ඇති යෝජනා

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මල පිරිපහදු මධ්‍යස්ථානය,කොම්පෝස්ට් අංගනය හා හෙළ බොජුන්හලට CCTV කැමරා පද්ධතියක් සවි කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා , ඉහත ව්‍යාපෘතිවල වැඩ මේ වන විට නිමවෙමින් පවතින බැවින්, ඉදිරියේ දී ඒවායේ කාර්යයන් විනිවිදභාවයකින් පවත්වා ගැනීමටත්,නිසි අධීක්ෂණයකින් සිදුකිරීමටත්,සහ ආරක්ෂාව සඳහාත් CCTV කැමරා පද්ධතියක් සවි කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙමින් ඒ සඳහා සභා අනුමැතිය අවශ්‍ය බව ප්‍රකාශ කළේ ය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. පෙරටු කාර්යාලය සඳහා කවුන්ටර් එකක් පුටු සහ අවශ්‍ය උපකරණ ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමත් සමඟ කාර්යාලයේ පිරි සැකැස්ම ක්‍රමානුකූල කිරීම සඳහා පෙරටු කාර්යාලය ස්ථාපිත කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා සුදුසු කවුන්ටර් එකක් ,පුටු හා අවශ්‍ය උපකරණ ලබා ගැනීම අවශ්‍ය බව පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

III. ඩයලොග් ආසියාටා සමාගම විසින් පොල්වත්තහේන ,මල්මීකන්ද,ඕපනායක ස්ථානයේ සභාවේ අනුමැතියකින් තොරව සංනිවේදන කුළුණක් ඉදිකිරීම හේතුවෙන් මාර්ගයට විශාල වශයෙන් හානි සිදු වී ඇති බැවින් ඒ සම්බන්ධව නීතිමය පියවර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවේ සඳහන් කරුණ සම්බන්ධයෙන් සභාව විසින් මේ වන විට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් රු.500.000.00ක තැම්පතු මුදලක් සභාවේ තැම්පත් කරන ලෙසත් ,සභාවේ අවසරය ලබා ගන්නා තෙක් ඉදිකිරීම් නවත්වන ලෙස දන්වා 2021.10.18 දිනැතිව ලිපියක්ද යොමුකර තිබියදී මෙසේ ක්‍රියා කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කරුණු දක්වන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා,සන්නිවේදන පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය කාර්යයක් වුවත්,මෙවැනි ලාභ ලබන බහු ජාතික සමාගම් වලට මෙසේ බල ප්‍රදේශයේ අයිතා අන්දමින් ක්‍රියා කිරීමට කිසිසේත් ඉඩ නොතැබිය යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා,මාර්ගයන්ට සිදු වූ පාඩුව නොඅඩුව අයකර ගත යුතු බව තරයේ සඳහන් කළේය.තවද අදහස් එක්කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා බල ප්‍රදේශය තුල මෙවැනි අනවසර ඉදිකිරීම් සිදුවන්නේද යන්න අධීක්ෂණය කල යුතු බවත්,යම් ඉදිකිරීමක් සිදු කරන්නේ නම්

සිදුවිය හැකි හානි සඳහා යම් ඇප තැම්පතුවක් රඳවා ගැනීම සුදුසු බව ප්‍රකාශ කළේය.ඒ අනුව ඉහත සමාගම විසින් සිදු කර ඇති හානිය අයකර ගැනීම වෙනුවෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV. නැණසල ක්‍රියාකරු කේ.බුද්ධිකා ප්‍රියදර්ශනී මියගේ දීමනාව රු.10,000/= කින් වැඩි කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නැණසල ක්‍රියාකරු වශයෙන් සේවයේ නියතු කේ.බුද්ධිකා ප්‍රියදර්ශනී මියටමාසිකව රු.10,000.00 ක දීමනාවක් ගෙවන අතර,මේ වන විට පවතින ආර්ථික තත්වය සැලකිල්ලට ගනිමින් දැනට ලබා දෙන දීමනාව ප්‍රමාණවත් නොවන අතර මාසිකව රු.20,000.00ක දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇය විසින් දිගින් දිගටම ඉල්ලීම් කර ඇති බැවින් ,එම යෝජනාව සලකා බලා ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

V. පුස්සතොට සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගොඩනැගිල්ල සඳහා රජයේ ඉඩම සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධව කරුණු දැක්වූ ගරු සභාපතිතුමා කලටුවාකන්ද ග්‍රාම නිලධාරී වසමේ කැ.සි. අංක 620206 කලාප 03 කැබලි අංක 168 දරණ ප්‍රමාණය පර්. 24ක් වන රජයේ බිම් කොටසින් කොටසක් ප්‍රාදේශීය සභාවට අයිතිව ඇති බැවින් එම කොටස සමෘදිධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම යෝජනාව ඉදිරිපත් කල බව ප්‍රකාශ කළේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා සභාව සතු එම භූමිය ලබා දීමට තමන් විරුද්ධ බව ප්‍රකාශ කළේය.එසේම මෙම ඉඩම තුල සභාවට ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සුදුසු බව ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා තමන්ද මෙම යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මෙම යෝජනාවට සියළු දෙනා සිය විරුද්ධත්වය ප්‍රකාශ කල බැවින් ඉහත යෝජනාව සභා සම්මත නොවිණ.

VI. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත සභාව සතු 252-6373 කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් රු.1,045,400.00ක මුදල තෙබුවන ගරාජ් වෙත ගෙවීමට සභා අනුමැතිය අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්රතිපාදන මත සභාව සතු 252 - 6373 කැබ් රථය තෙබුවන ගරාජ් වෙතින් අළුත්වැඩියා කල අතර අදාල ප්‍රතිපාදන ලද විට ගෙවීම් සිදු කිරීමට සභා අනුමැතිය අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VII. පහත සඳහන් කර්මාන්ත සඳහා ගෙවීම් අනුමත කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

| පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | කොටස් බිල (රුපියල්) |
|---|---|
| • කන්දෙවිහාර ජල මූලාශ්‍රයට ගබඩා ජල ටැංකියක් ලබා ගැනීම | 543,500.00 |
| • පූර්ව ළමාවිය සංවර්ධනය හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 1,441,446.98 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

VIII. 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනත වූ 267 වන අධිකාරිය ප්‍රකාරව විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තිය අනුව, වැලිගෙපොල ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුල විනෝද බදු ආඥා පනත යටතේ මුදල් අය කරනු ලබන සන්දර්ශනයක් වන විටකදී,එසේ සංදර්ශනය සඳහා ඇතුළුවීමෙන් අයකරනු ලබන මුදලින් 10% ක ප්‍රතිශතයක් යටතේ වූ විනෝද බද්දක් අය කළ යුතු බව යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ සම්බන්ධව කරුණු පැහැදිලි කල ගරු සභාපතිතුමා සභාවේ ආදායම ශක්තිමත් කිරීමේ අරමුණින් විනෝද බදු ආඥා පනත ප්‍රකාරව මෙම සභාව විසින් 10% ක (සමස්ත ලැබීම් වලින්) විනෝද බද්දක් පනවා අය කිරීමටත්, නාට්‍ය සහ රූකඩ සංදර්ශන සඳහා මෙය බල නොපාන බවත් ප්‍රකාශ කරමින් මෙතෙක් ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුල සිදු කෙරෙන විනෝද සංදර්ශන තුලින් විනෝද බදු අය කිරීමේ දීඑය පනවා ගෙන නොමැති වීමෙන් නීතිමය වශයෙන් පවතින ගැටළුව නිරාකරණය කිරීම සහ නෛතික රාමුව තුල ඊට අදාල බදු අය කිරීමත්, සභාවේ ආදායම ශක්තිමත් කිරීමත්, යන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදහස ඇතිව සිදුකරන බව පෙන්වා දෙන ලදී. ඒ අනුව එම යෝජනාව ඒකමතික සභා සම්මත විය.

IX. ප්‍රයෝජනයට ගත නොහැකිව ඉවතලන නොදිරණ කසල පරිසරයට මුදා නොහැර පුත්තලම සිමෙන්ති කම්හලට යැවීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,කසල මධ්‍යස්ථානයට රැගෙන එන නොදිරන කසල වලින් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යොදාගැනීමට නොහැකිව ඉතිරි වන ප්‍රමාණය පරිසරයට මුදා නොහැර පුත්තලම සිමෙන්ති කර්මාන්ත ශාලාවට යැවීම සුදුසු බව ප්‍රකාශ කළේය.ඒ අනුව ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

X. උද්ගතව පවතින කොරෝනා වසංගත තත්වයෙන් ජන ජීවිතයට එල්ලවී ඇති බලපෑම හේතුවෙන් පහත සඳහන් සභාව සතු දේපල සඳහා තුන් වරක් ටෙන්ඩර් කැඳවීම් සිදු කළද ගැනුම්කරුවන් කිසිවෙක් ඉදිරිපත් නොවීම සලකා පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 03/2020 හි 17 වන වගන්ති ප්‍රකාරව අවම මාසික බදු මුදල් පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

| දේපල | පැවති මාසික බදු මුදල(රුපියල්) | සංශෝධිත අවම මාසික බදු මුදල (රුපියල්) |
|---|---|---|
| වැලිගෙපොල සති පොල | 13,180.00 | 10,000.00 |
| ඕපනායක සති පොල | 7,230.00 | 7000.00 |
| වැලිගෙපොල සතිපොල මාළු ලැල්ල | 24,550.00 | 15,000.00 |
| ඕපනායක මාළු ලැල්ල | 5,600.00 | 5,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XI. සංචරණ සීමා පනවා තිබූ 2021 ජූනි,ජූලි මාස සඳහා බදු කපා හැරීම සම්බන්ධයෙන් 2021.08.12 මාසික සභා රැස්වීමේ තීරණ අංක 5.1(VI ) යෝජනාව මගින් ගනු ලැබූ තීරණයේ ඕපනායක පොළ ඉදිරිපිට අංක 08 කඩ කාමර ට යාබද කොටස ,පෙළෙහවත්ත බිම් කොටස් 07 සහ පැරණි දුම්රියපල පාරේ ඇති ගොඩනැගිල්ල සඳහා අධි ගාස්තුව සඳහන් වී නොමැති බැවින් එකී යෝජනාව පහත සඳහන් පරිදි සංශෝධනය වන බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අයකර නොහැකිව ලේඛනගතව ඇති ඕපනායක කඩකාමර 08 සඳහා ජූනි සහ ජූලි මස දෙක වෙනුවෙන් රු.32,000.00 ක මුදල හා ගල්පාය කඩකාමර 05 සඳහා ජූනි සහ ජූලි මස දෙකෙහි අයවිය යුතු රු.5000.00 ක මුදල බදුකුලී ලේඛනයෙන් කපා හැරීම පිණිස පළාත් සභා අනුමැතිය ලබා ගැනීමටත්,

එමෙන්ම,ඕපනායක කඩකාමර 08 සඳහා ජූනි සහ ජූලි මස දෙක වෙනුවෙන් අයකර ගත යුතු රු.32,000.00 ක මුදලට අදාල රු.3200.00ක අධි ගාස්තු ලේඛනයෙන් ඉවත් කිරීමටත්, පෙළගෙවත්ත ඉඩම් කොටස් 07,ඕපනායක පොල ඉදිරිපිට අංක 08 කාමරයට යාබද කොටස හා පැරණි දුම්රිය පාරේ ඇති ගොඩනැගිල්ල සඳහා ජූනි හා ජූලි මාස දෙකෙහි අධි ගාස්තු රු.6,663.38 ක මුදල කපා හැරීමටත්,ගල්පාය කඩකාමර 05 සඳහා ජූනි සහ ජූලි මස දෙකෙහි අයවිය යුතු රු.5000.00 ක ගාස්තුවට අදාල රු.500.00 අධි ගාස්තුව ලේඛනයෙන් ඉවත් කර ගැනීමටත් සභාව සාකච්ඡා කර තීරණය කිරීමෙන් පසුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XII. සභාව සතු කම්පැක්ටර් රථය සඳහා ටයර් මිලදී ගැනීම වෙනුවෙන් රු.508,356.00 ක මුදලක් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවට ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XIII. වැලිගෙපොල පොල කඩකාමර ඉදිකිරීම සඳහා වූ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා වැලිගෙපොල නගරයේ පවතින සභාව සතු පොල භූමියේ පවතින අවිධිමත් කඩකාමර ඉවත් කර විධිමත් පරිදි සකස් කිරීම සුදුසු බවත්,නගරයේ පවතින තදබදයට එය විසඳුමක් වන බවත් පෙන්වා දුන් අතර,ඉදිරිපත් කල ගොඩනැගිලි සැලැස්මට අනුව කඩකාමර සකස් කිරීම සුදුසු බව ප්‍රකාශ කළේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XIV. කසල මධ්‍යස්ථානයට විදුලිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා සභාවේ කසල මධ්‍යස්ථානයේ කසල වෙන් කිරීම් කටයුතු සිදු වෙන බැවින් හා ඉදිරියේදී මෙම ස්ථානයේ රාත්‍රී මුරකරුවකුද සිටිය යුතු බැවින් විදුලිය ලබා ගැනීම අවශ්‍ය බව ප්‍රකාශ කිරීමත් සමඟ එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XV. හඳගිරියේ පැරණි අලිවැට ඉදි කිරීමේ දී පාර කැපීම සඳහා JCB යන්ත්‍රය ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හඳගිරිය ප්‍රදේශයේ පවතින වන අලි මිනිස් ගැටුම දරුණු තත්වයට පත්වී ඇති අවධියක ප්‍රාදේශීය සභාව විසින් එම ගැටළුවට විසඳුම් සොයමින් දිගින් දිගටම විවිධ යෝජනා හා සැලසුම් ඉදිරිපත් කල අතර,මේ වන විට වන ජීවී දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැරණි අලි වැට නැවත ප්‍රතිසංස්කරණය කිරීමට එකඟ වී ඇති බැවින් එයට දක්වන සහයෝගයක් ලෙස රක්ෂිතය ඇතුලත වනජීවී නිලධාරීන්ට ගමන් කිරීම සඳහා මාර්ගයක් කැපීමට සභාවේ JCB යන්ත්‍රය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කළේය.

අවස්ථානුකූලව එම ප්‍රදේශයේ පවතින වන අලි තර්ජනය සලකා බලා ඉහත යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා මෙදින සභා රැස්වීමට නොපැමිණි හෙයින් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගේ පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ප්‍රදේශය පුරා සැරිසරන වීදි සුනකයින් පාලනය සඳහා වැඩසටහනක් සංවිධානය හෝ ජල භීතිකා එන්නත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මැටිහක්වල ක්‍රිඩා පිටිය අත්පත් කරගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මැටිහක්වල ග්‍රාම නිලධාරී වසමට ක්‍රීඩා පිටියක් නොමැති අතර ගම්වාසීන් විසින් කහවත්ත වැවිලි සමාගමට අයත් ඉඩම් කොටසක් ක්‍රීඩා පිටියක් ලෙස දැනට භාවිතා කරමින් සිටින අතර එම බිම් කොටස අත්පත් කරගෙන ක්‍රීඩාපිටිය සංවර්ධනය කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. මල්මීකන්ද වසමේ හපුගහගොඩැල්ල මාර්ගය මීටර් 500ක් පමණ සභාවේ JCB යන්ත්‍රය යෝදා සංවර්ධනය කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී .

එම යෝජනාව ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**I.** හඳගිරිය ප්‍රදේශයේ වන අලි ප්‍රහාරයෙන් දැඩිසේ තුවාල ලබා රෝහල් ගතව සිටින ඩී.එම්.චන්ද්‍රාවතී මහත්මියගේ ඉදිරි ප්‍රතිකාර සඳහා ඇයට රු.50,000.00ක මුදල් ආධාරයක් ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා ,ඉහත නම් සඳහන් කාන්තාවගේ පවුල් ඒකකය සඳහා ස්ථිර දාදායම් මාර්ගයක් නොමැති බවත්.මානසික රෝගාබාධයෙන් පෙලෙන දරුවකුද සිටින බැවින් ඉතා දිළිදු ජීවිකාවක් ගෙවන ඇයට මෙම ආධර මුදල ලබා දීම සුදුසු බව ප්‍රකාශ කලේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>**

**7.**

### 7.1. 2021.12.17 හා 2022.01.12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ තීරණ අංක 1770 සිට 1872 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 7.2. ප්‍රසම්පාදන කමිටු වාර්තා

2021.11.11 වන දින හා 2021.12.16 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තා මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 8. ආදායම් වියදම් වාර්තා

### 8.1. 2021 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 684,843.23 | වැටුප් හා දීමනා | 3,576,564.28 |
| කුලී | 92,141.75 | ගමන් වියදම් | 22,682.00 |
| බලපත්‍ර ගාස්තු | 166,700.00 | සැපයුම් හා උපකරණ | 379,533.00 |
| සේවා සඳහා ගාස්තු | 439,452.20 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 80,750.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,702.79 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 407,236.25 |
| වෙනත් ආදායම් | 40,021.59 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,802,638.25 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 4,193,499.81 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 34,034.65 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 4,500,800.18 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 4,193,499.81 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 141,964.67 | සේවක ණය | - |
| තැන්පත් | 225,559.52 | තැන්පත් | 80,528.02 |
| අත්තිකාරම් | 20,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 20,000.00 |
| සමුච්චිත අරමුදල | 400.00 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 387,924.19 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 100,528.02 |
| මුළු එකතුව | 4,581,424.00 | මුළු ගෙවීම් | 4,601,328.20 |

### 8.2. 2021 නොවැම්බර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 9. පසු ගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

# 10. වෙනත් කරුණු

## 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

සභාවට ලැබෙන උසාවි දඩ හා වරෙන්තු ආදායම් වැඩි වීම සතුටට කරුණක් නොවන බවත්, විනයගරුක යහපත් සමාජයක් බිහි කිරීම උදෙසා එම මුදල් යොදවා ගත යුතු බවත්, ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා,බල ප්‍රදේශය තුල විශාල මාර්ග ප්‍රමාණයක් කාපට් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වී ඇති නමුත්,ඇතැම් මාර්ගවල වැඩ කටයුතු අතරමග නතර කර ඇති බවත්,ඇතැම් මාර්ග සංවර්ධනය ඉතා මන්දගාමීව සිදුවන බවටත් කරුණු අනාවරණය කල අතර ඒ සම්බන්ධව සොයා බැලීමක් කරන ඉල්ලා සිටියේය.

තවද රටේ පවතින අධික බඩු මිල ඉහළ යාම සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා රජය විසින් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා පාලන මිලක් පැනවීමට හෝ වෙන යම් සහනයක් ලබා දීමට ක්‍රියා නොකරන බැවින් ජනතාව පත්වී ඇති අසීරුතා වලට රජය මැදිහත් වීමක් සිදු නොකිරීම සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කල අතර, ජනතාව මෙසේ පීඩාවට පත් පත්වී ඇති බවට ප්‍රාදේශීය මට්ටමේ නියෝජිතයින් වශයෙන් ගරු ජනාධිපතිතුමා දැනුවත් කර ජනතාවට සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා සිටියේය.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

හඳගිරිය,හඳගිරිගොඩ ප්‍රදේශයේ ඇති වන අලි ගැටළුවට යම් විසඳුමක් ලෙස පැරණි අලි වැට ඉදිකිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට සිය ස්තුතිය පුද කල ගරු මන්ත්‍රීතුමා , කපුගල මාර්ගය අධික බර වාහන ධාවනය හේතුවෙන් අබලන් වීම සම්බන්ධයෙන් පෙර පැවති සභාවකදී ද කරුණු අනාවරණය කල අතර මේ වන තෙක් එම මාර්ගයේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු වී නොමැති බැවින්, කඩිනමින් එම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටියේය. තවද බල ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන ජීවන ගැටළු සලකා බලා වගා කටයුතු කරගෙන යාමට පොහොර සහනාධාරයක් සභාව විසින් ලබා දීමට හැකියාවක් පවතින්නේ නම් එය ප්‍රදේශයේ ජනතාවට ඉමහත් අස්වැසිල්ලක් වන බවට ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

පනාන මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සිය ස්තුතිය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා, එම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. තවද පනාන පාලම ආසන්න විශාල කුඹුක් කොටයක් හිර වී ඇති අතර එය JCB යන්ත්‍රය යොදා ඉවත්කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

එසේම මැද්දෙකන්ද මාර්ගය දැඩිසේ අබලන් වී ඇති අතර කාපට් ව්‍යාපෘතියට ඇතුලත්වී ඇති බව සඳහන් කරමින් ප්‍රාදේශීය ලේකම් මුදල් ප්‍රතිපාදන වෙන් නොකරන බව ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ පවුල් හතළිහකට පමණ සමෘද්ධි සහනාධාරය අහිමි කර ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමිය, ජනතාව අසරණ තත්වයට පත් වී ඇති

මෙවන් මොහොතක දේශපාලන වාසි බලා සමෘද්ධි සහනාධාරය කපා හැරීම සුදුසු නොවන බවත් ඒ සම්බන්ධව සොයා බලා සාධාරණයක් ඉටු කරන ලෙසත් ඉල්ලා සිටියාය.

එසේම ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සම්බන්ධව දැඩි සම්බාධක නොපනවන ලෙසත්,ඒ තුලින් රටට යම් ආදායමක් ලබා ගත හැකි බැවින්, එවැනි කර්මාන්ත දිරිගැන්වීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කරන ලද අතර 2022 නව වසර සියලු දෙනාට සුබ නව වසරක් වේවායි! ප්‍රාර්ථනා කළාය.

### 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

පොල් වත්තහේන මාර්ගය සංවර්ධන කටයුතු සිදු කර දෙන ලෙසත් එම මාර්ගයේ පාලම ඉදිකර දෙන ලෙසත් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා ගල්ලිනවත්ත මාර්ගයේ වැඩ නතර වී ඇති බවත්, ඒ සම්බන්ධව සොයා බලා යුතු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

එසේම ප්‍රදේශයේ පවතින සුසාන භූමි වෙන් කර ,සෑම ග්‍රාම නිලධාරී වසමකටම සුසාන භූමියක් බැඟින් වෙන් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

රටේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා කිරීම පල රහිත බැවින් ඒ සම්බන්ධයෙන් කාලය වැය නොකරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා,පොහොර ගැටළුව නිසා ගොවීන්ට අස්වනු අඩු වීම හේතුවෙන් සිදු වී ඇති පාඩුව සම්බන්ධව යම් පියවරක් ගත යුතු බවත්, එසේම ඒ සඳහා වන්දි ලබා නොදෙන්නේ නම් ගොවින් ඉදිරියේ දී උද්ඝෝෂණ ක්‍රියා මාර්ගයන්ට යොමු වීමට ඉඩ ඇති බැවින් කඩිනමින් ඒ සඳහා විසඳුම් ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කරුනු දක්වන ලදී.

එසේම වසර හතරක කාලයක් පුරා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමේ දී තමන්ට සහයෝගය ලබාදුන් ගරු සභාපතිතුමා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමන්ලාටත් සිය ස්තුතිය පුද කල ගරු මන්ත්‍රීතුමා තම පියා ද මෙම සභාවේ සභාපති වරයෙකු හා විපක්ෂ නායකවරයෙකු ලෙස ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් ඉටු කළ බවත්, තමන් ද පියා සමඟ එක්ව ප්‍රදේශය ජනතාව වෙනුවෙන් විශාල සේවයක් සිදු කළ බවත් සිහිපත් කල අතර, එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම් නායක ධුරයෙන් තමන් ඉවත් කිරීම සම්බන්ධයෙන් තම කණගාටුව ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා ඉදිරියේදී සමගි ජන බලවේගය හා එක්ව තම දේශපාලන කටයුතු සිදු කරන බව තරයේ ප්‍රකාශ කර සිටියේය.

### 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

වන අලි ගැටළුව විසඳීමට යම් උත්සාහයක් දැරීම සම්බන්ධයෙන් ඒ සඳහා මැදිහත් වූ සියලු දෙනාට සිය ස්තුතිය ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා, වන අලි ප්‍රහාරයෙන් මිය ගිය පියදාස මහතා ගේ බිරිඳ සහ දියණිය කැලෑව මැද පිහිටා ඇති අනාරක්ෂිත නිවසක වාසය කරන බවත්, ප්‍රාදේශීය ලේකම් ගේ මැදිහත් වීමෙන් ඔවුන්ට නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා දීමට එකඟ වී ඇති බැවින් ඔවුන්ගේ අසරණ භාවය සලකා බලා හැකි උපකාරයක් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

තවද අලි වැට නැවත ඉදිකරන තෙක් ප්‍රධාන මාර්ගයේ අලින් ගමන් ගන්නා ස්ථාන සඳහා වීථි පහන් සවි කර දෙන ලෙස ගරු මන්ත්‍රී තුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

ඌරාවල ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය කොහු කර්මාන්ත ශාලාව දැනට වසර 4ක කාලයක සිට වසා දමා ඇති අතර එහි සේවයේ නිරතව සිටි කාන්තාවන් මේ වන විට රැකියාව නොමැති වීමෙන් අසරණ තත්ත්වයට පත්වී ඇති බවට කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමිය, එම කර්මාන්ත ශාලාව නැවත විවෘත කර දේශීය කර්මාන්ත නගා සිටුවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියාය.

### 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

සභාවේ විපක්ෂ කණ්ඩායම් නායක ධුරයට පත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මැතිතුමාට සිය සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා, අම්මඩුව සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බෙහෙත් ලබාදීම නැවත ආරම්භ කර ඇති බැවින් එම ස්ථානයට ජලය ලබා ගැනීමේ ගැටළුවක් පවතින බවත් ජලය ලබා ගැනීම සඳහා සභාවේ යම් සහයෝගයක් ලබා දීම සුදුසු බවත්. ප්‍රකාශ කළේය.

එසේම වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, බදුල්ලේගම ජල ව්‍යාපෘතිය විදුලි බලය මදි කම හේතුවෙන් අක්‍රිය වෙමින් පවතින බැවින් එම ප්‍රදේශයට තෙකලා විදුලි ලබා ගැනීමට මේ වනවිට අදාළ පාර්ශ්ව දැනුවත් කලද මේ වන තෙක් එය ඉටුවී නොමැති බවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

තවද රටේ පවතින ආර්ථික තත්ත්වය පිළිබඳව කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා ගොවීන්ගේ පොහොර ගැටළුව හා රටේ පවතින අධික ලෙස බඩු මිල ඉහල යාම සම්බන්ධයෙන් සිය අප්‍රසාදය ප්‍රකාශ කළ අතර මේ වන විට රටේ ජනතාව දැඩිසේ පීඩාවට පත්වී සිටින බවත්, තමන් දරන දේශපාලන මතය කුමක් වුවත් ආණ්ඩුව විසින් සිදු කරනු ලබන යහපත් කාර්යයන් මෙම ක්‍රියාවන් හේතුවෙන් යටපත් වී ඇති බවත්, පෙන්වා දුන් අතර මෙම ගැටළුව හැකි ඉක්මනින් කරාකරණය නොකරන්නේ නම් ඉදිරියේ දී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්ගේ මිල මීට වඩා ඉහළ යාම හේතුවෙන් ජනතාවගේ කුසගිනි නිවා ගැනීමට නොහැකිව දැඩි සේ අසරණ වන බව ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා මෙම ගැටළු සම්බන්ධව පාලකයින්ගේ නෙත ගැටේවායි! ප්‍රාර්ථනා කලේය.

### 9.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ නව කණ්ඩායම් නායක ධුරයෙන් පිදුම් ලැබූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මැතිතුමාට සිය සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා ,හුණුවල වතු රෝහලේ පවතින විවිධ අඩුපාඩු සම්බන්ධයෙන් තමන් දිගින් දිගටම සභාවේ කරුණු අනාවරණය කල අතර මේ වන විට පෞද්ගලික ධානපතියන්ගේ පරිත්‍යාග මත එම රෝහලේ විශාල වැඩ කොටසක් නිම කිරීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධයෙන් ඔවුන්ට සිය ස්තූතිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කරගත් අතර එම රෝහලේ නිල නිවසේ වැඩ කටයුතු අවසන් කර ගැනීමට තවදුරටත් මුදල් ප්‍රතිපාදන අවශ්‍ය වී ඇති බැවින් ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කරවන ලෙස ඉල්ලා සිටියේය.

එසේම රටේ පවතින භාණ්ඩ මිල ඉහළ යාමත් සමග ජනතාවට සිදුවන අපහසුතා මගහරවා ගැනීම සඳහා සතොස වෙළඳසැල් වලට අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකින් තොරව ලබා දෙන ලෙසත්, ජනතාවට එම භාණ්ඩ අපහසුතාවයකින් තොරව ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

තවද වතු සමාගම් සතු වගා නොකල ඉඩම් රජයට පවරා ගෙන වගා කරන පුද්ගලයින්ට ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කල යුතු බවත්, ගොවිතැන් කරන පුද්ගලයන් හට මෙම ඉඩම් ලබාදීම තුලින් රටේ

ආර්ථිකයට යම් සහනයක් ලබාගත හැකිවන බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා වතු සමාගම් සතු පැරණි රබර් ගස් ජනතා වෙත ලබාදීමේ වැඩසටහනක් සකස් කිරීම තුලින් යම් ආදායමක් උපයා ගත හැකි වන බවත් ප්‍රකාශ කළේය.

අවසාන වශයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා,පසුගිය වසරේ සභා බල ප්‍රදේශය විශාල වැඩ කොටසක් ඉටු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සිය ස්තූතිය ප්‍රකාශ කරමින් ,සැමට සුභ නව වසරක් වේවායි! ප්‍රාර්ථනා කළේය.

### 9.11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

තැන්නගේන මාර්ගයේ පැති බැම්මක් ඉදිකිරිම අතරමග නතර කර ඇති බවත්, එම පැති බැම්ම අවිධිමත් ලෙස ඉදිකර ඇති බවත්, ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමිය එම ස්ථානයෙන් වාහන ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් ඇති බැවින් ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටියාය.

### සභා රැස්වීමේ නිමාව

සභා බල ප්‍රදේශයේ මාර්ග වල වැඩ කටයුතු මන්දගාමී වීමට කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වලතා මෙන්ම සිමෙන්ති හිඟයද හේතු වී ඇති බවට කරුණු දැක්වූ ගරු සභාපතිතුමා, පසුගිය කාලයේ රට තුල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රටේ මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් දරුණු වසංගත තත්වයන් පාලනය කර ගනිමින් රටේ සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යාමේදී යම් යම් බාධක ඇති වන බව ප්‍රකාශ කල කළේය.

තවද, මෙම සියළු ගැටළු මධ්‍යයේ බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් ඉටුවිය යුතු කාර්යයන් සියළු දෙනා එක්ව ඉදිරියටත් ඉටු කලයුතු බව පෙන්වා දෙමින් අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින්,ගරු සභාපතිතුමා විසින් ප.ව. 1.00 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව